# 9 දෙවන තේමාව - දේව වරප්‍රසාද ලබා දෙන සක්‍රමේන්තු

## 2.1. ශුද්ධාත්ම වරමින් පූර්ණ වෙමු.

- ☆ ජේසුස් වහන්සේ බලය ඇත්තකු සේ ක්‍රියාකාරි වීම.
- ☆ ජේසුස් වහන්සේගේ මානව දයාව සොයා ජනතාව පැමිණීම
- ☆ තමන්ගෙන් ප්‍රශ්න කළ අයට ජේසුස් වහන්සේ ප්‍රඥාවන්තව පිළිතුරු දීම
- ☆ ජනතාව ජේසුස් වහන්සේගේ ප්‍රේමය අත්දැකීම
- ☆ දේව පණත්වලට අනුව ජීවත්වීම

- ජේසුස් වහන්සේගේ ජීවිතය තුළ මෙවැනි දේ සිදුවූයේ ඇයි?
- හේතු දක්වන්න.

ජේසුස් වහන්සේ
ශුද්ධාත්මයාණන්ගෙන් පූර්ණ වූ සේක.
පෙන්තකොස්ත දින ශුද්ධාත්මයාණෝ
අපෝස්තුලුවරුන් වෙත වැඩම කර,
පසුව මුල් කිතුනු සභාව තුළ ද නව සමාජ
පැවැත්මක් උදා කළ සේක.


නොමිලේ බෙදා හැරීම සඳහා ය.

## මුල් කිතුනු සභාවේ ජීවිතය

"ඔව්හූ ප්‍රේරිතවරුන්ගේ ඉගැන්වීමෙහි ද සහභාගිකමෙහි ද රොටි කැඩීමෙහි ද යාච්ඤාවෙහි ද නිරත ව කල් ගත කළහ. සියලු දෙනා තුළ ගෞරවාන්විත භීතියක් ඇති විය. ප්‍රේරිතවරුන් අතින් බොහෝ අරුම පුදුම දේ හා ලකුණු සිදු විය. සැදැහැවත් සියල්ලෝ එක් වී හැම දෙය ම පොදුවේ තබා ගත්හ. ඔව්හු තමන්ගේ ඉඩ කඩම් හා දේපල විකුණා එකිනෙකාගේ උවමනාවේ හැටියට සියලු දෙනා අතර බෙදා ගත්හ. තව ද ඔව්හු දිනපතා නො කඩවා ම එක්සිත් ව දේව මාලිගායේ රැස්වෙමින් ද ගෙයින් ගෙට යමින් ද රොටි කඩමින් ද තම තමන් අතර ප්‍රීතියෙනුත් ත්‍යාගිවන්ත සිතිනුත් ආහාර බෙදා ගනිමින් ද දෙවියන් වහන්සේට ප්‍රශංසා කරමින් හා සියල්ලන්ගේ ප්‍රසාදය ලබමින් ද කල් යැවූහ."

(ක්‍රියා 2:4247)

**අභ්‍යාස පොතට කරුණු සොයා ලියන්න.**

| ශුද්ධාත්ම ආගමනයට පෙර සමාජ ලක්ෂණ | ශුද්ධාත්ම ආගමනයට පසු සමාජ ලක්ෂණ |
|---|---|
| ❄ | ❄ |
| ❄ | ❄ |
| ❄ | ❄ |
| ❄ | ❄ |
| ❄ | ❄ |



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

මෙලෙස වෙනස් ලෙස ජීවත් වීමට
මූලික හේතුව වූයේ ශුද්ධාත්මයාණන්ගෙන් පූර්ණ වී
ක්‍රියාකාරි වූ මුල් සමාජය තුළ දක්නට ලැබුණ
ජීවිත සාක්ෂිය යි.
එම ශුද්ධාත්මයාණන් වහන්සේ අභිවෘද්ධි ආලේපයේ
සක්‍රමේන්තුව තුළින් අපට දීමනා හා ඵල ලබා දෙන සේක.
ඒ නිසා අපි පරිණත කිතුනුවන් මෙන් සාක්ෂි දරමු.

ඔබේ මතකයට



ශුද්ධාත්ම දීමනා
කිතුනු දිවිමග
සාර්ථක කර ගැනීම
සඳහා අප ලබන
පිටුවහලකි.

**ශුද්ධාත්මයාණන් තුළින් ලැබෙන ආධ්‍යාත්මික දීමනාඃ**

- උවදෙස් දීමේ ප්‍රඥාව
- සුව කිරීමේ වරම
- දිවැසි වැකි කීමේ බලය
- විවිධ ශබ්ද වලින් කතා කිරීම
- විශ්වාසය
- හාස්කම් කිරීමේ බලය
- ආත්ම විසඳීමේ හැකියාව
- ශබ්ද පහදා දීමේ හැකියාව

(1 කොරෙන්ති 12:411)

## වැඩිදුර අධ්‍යයනයට

**යෙසායා 11:2**
**රෝම 12:68**
**එපිස 4:11**

### ශුද්ධාත්මයාණන් වහන්සේ දානය කරන ඵල :

ශුද්ධාත්මයාණන්ගේ ඵල ලබා සමාජය තුළ පොදු යහපතට කටයුතු කරන අය හොඳ ඵල දරන ගසකට සමානය. එම ඵල ශුද්ධාත්මයාණන් කරණ කොටගෙන ඇතිවන්නකි. ඒ බව ශු. පාවුළු තුමා ගලාති ලිපියේ මෙසේ ප්‍රකාශ කර ඇත.

> "ශුද්ධාත්මයාණන් කරණ කොටගෙන ඇතිවන ප්‍රතිඵල නම් ප්‍රේමය, ප්‍රීතිය, සාමය, ඉවසීම, කරුණාව, යහපත්කම, විශ්වාසකම, මෘදුකම හා ආත්ම දමනය යන මේවාය."
>
> (ගලාති 5:2223)

### ඔබේ දැනගැනීම සඳහා

1. **ප්‍රේමය** සේවයේ ජීවිතයක් ගෙවීමට අප පොළඹවයි.

2. **ප්‍රීතිය** දෙවියන් වහන්සේ තුළ සතුටින් ජීවත් වීමටත් ඒ සතුට අන් අය සමග බෙදා ගැනීමටත් අප පොළඹවයි.

3. **සාමය** යහපත් හා නිවැරදි ලෙස තම අයිතිවාසිකම් රැක ගැනීමටත් ඊට සරිලන යුතුකම් ඉටු කිරීමටත් අප පොළඹවයි.

4. **ඉවසීම** මනුෂ්‍යයා දුබලතාවය හමුවෙහි නිතර ඉවසීමටත්, ඒ ඒ අවස්ථා වල දී වරද අමතක කර සමාව දීමටත් අප පොළඹවයි.

5. **කරුණාව** මනුෂ්‍යයාට ද සතුන්ට ද පොදුවේ මුළු මහත් මැවිල්ලට ද සානුකම්පිත වීමට අප පොළඹවයි.

6. **යහපත්කම** නපුර ත්‍යාජ කර සුමග යාමට අප පොළඹවයි.

7. **විශ්වාසවන්තකම** දෙවියන් වහන්සේ හා මනුෂ්‍යයා ඉදිරියේ විශ්වාසවන්ත වීමට හා දෙන පොරොන්දු ඉටු කිරීමට අප පොළඹවයි.

8. **මෘදුකම** දේව කැමැත්තට අවනත වීමට හා අන් අය ගැන සැලකිලිමත් වීමට අප පොළඹවයි.

9. **ආත්ම දමනය** තම සිත තුළ ඇතිවන තෘෂ්ණා පාලනය කරගෙන ආදර්ශවත් ව ජිවත් වීමට අප පොළඹවයි.

**අභිවෘද්ධි ආලේපයේ ප්‍රතිඵල**

පෙන්තකොස්ත දින දී ශුද්ධාත්මයාණන්
අපෝස්තුලුවරුන් අභිෂේක කළ සේම මෙම ප්‍රසාද නිධානය
ලබන්නාවූ අය ද අභිෂේක කරන සේක.
අප බෞතිස්ම ස්නාපනයෙන් ලැබූ වරම ගැඹුරු කර, ස්ථිර කර
වර්ධනය කරන සේක.
'අබ්බා පියාණෙනි' කියා ඇමතීමේ උරුමකරුවන් වී ක්‍රිස්තුන් වහන්සේ
සමඟ අප සමීප ව සම්බන්ධ කරන සේක. අප තුළ ශුද්ධාත්ම දීමනා
වර්ධනය කරමින් ශුද්ධ වූ සභාව සමග අපගේ සම්බන්ධතාව සම්පූර්ණ
කරන සේක. ශුද්ධාත්ම වරම් ලබමින් බලාපොරොත්තුව ප්‍රකාශ
කරන්නට ද උන්වහන්සේගේ සාක්ෂි කරුවන් වශයෙන් වචනයෙන්
හා ක්‍රියාවෙන් ඒ බලාපොරොත්තුව සුරැකීමට ද
ක්‍රිස්තුන් වහන්සේගේ
කුරුසය පිළිබඳ ව ලැජ්ජා නොවීමට ද
වරම් ලබා දෙන සේක.

**(ක.ස.ධ. 1303)**

ශුද්ධාත්ම දීමනා හා ඵල මගින්

- අපගේ බුද්ධිය ප්‍රබෝධවත් කරයි.
- අප තුළ එඩිතර භාවය නංවාලයි.
- අප ශුද්ධවන්ත කරයි.
- අප දේව වචනයේ සාක්ෂිකරුවන් කරයි.

## සංවාදයක්

**පැට්‍රික්**: ක්‍රිශාන්ත මොකද අද කවදාවත් නැති සතුටකින්.

**ක්‍රිශාන්ත**: අද මට හරිම සතුටුයි. මගේ කෑම එක මම දුප්පත් කෙනෙකුට පරිත්‍යාග කළා. එයා "පුතාට ජේසු පිහිටයි" කියලා මට කිව්වා.

**පැට්‍රික්**: එතකොට ඔයා අද බඩගින්නේ නේ ද? එන්න ක්‍රිශාන්ත මගේ කෑම එක බෙදාගෙන කමු. ඔයා දෙවිඳුන්ට ප්‍රසන්න දෙයක් තමයි කරලා තියෙන්නේ.

**ක්‍රිශාන්ත**: එතකොට ඔයා බඩගින්නේ නේ ද?

**පැට්‍රික්**: ඔයාගේ මුළු කෑම එක ම පරිත්‍යාග කරන්න පුළුවන් නම් මටත් පුළුවන් පරිත්‍යාග කරන්න. මේ කෑම එක අපි දෙන්නම කමු.

**ක්‍රිශාන්ත**: කෑමෙන් පමණක් නෙමෙයි. අපගේ ජීවිතය ම පරිත්‍යාගි ජීවිතයක් වෙන්න ඕනේ. අපෙන් නිතර ම අන් අයට සේවයක් වෙන්න ඕනේ. එතකොටයි ජේසුට ප්‍රසන්න පුද්ගලයන් වෙන්නේ.

(මෙයින් ඔබ සිතට දැනුණ දේ සාකච්ඡා කරන්න.)

**පරිත්‍යාග වීම නම් ක්‍රිස්තුන් වහන්සේ තුළ ජීවත් වීමයි.**

**අනුන් වෙනුවෙන් කරන**
**සෑම පරිත්‍යාගී සේවාවක් ම දෙවිඳුන්ට ප්‍රසන්න ය.**
**ජේසුස් වහන්සේ මුළු ජීවිතය පුරා ම කළේ**
**දෙවිඳුන්ට ප්‍රසන්න දේවල් ය.**
**දෙවිඳුන්ට ප්‍රසන්න වැඩ කරන පුද්ගලයෝ වීරයෝ ය.**
**වීරත්වයට අප යොමු කරන්නේ**
**ශුද්ධාත්මයාණෝ ය.**

**වැඩිදුර අධ්‍යයනය සඳහා..**

**රෝම 8:118 කියවා අධ්‍යයනය කරන්න.**

**අභ්‍යාස පොතට**

| ශුද්ධාත්මයාණන් ලැබූ අපි | ඔබ ජීවත් වන්නේ කෙසේද? |
|---|---|
| ❒ මිනිස් දුබලතාවලට වහල් නො වෙමු.<br>❒ ක්‍රිස්තුන් වහන්සේට නිතර ම අයිති වෙමු.<br>❒ නිතර ම දේව සම්බන්ධතාවය තුළින් ආධ්‍යාත්මික ජීවිතය වර්ධනය කර ගනිමු.<br>❒ පාපයට මැරී නව ජීවනයකට උත්ථාන වෙමු.<br>❒ ජීවනය හා ශාන්තිය උරුම කරගනිමු.<br>❒ සදා ජීවිතයේ උරුමය ලබමු. | ? |

**යදිමු නිරතුරු සුදතුම්**

ශුද්ධාත්මෙනි ////

වස්වාලමින් ඔබේ වරම්
මා ජීවිතයේ පුරවන් ඔබේ ආලෝකයෙන් //

පිරිපුන් ප්‍රේමය තුළ වැඩ වසනා ශුද්ධාත්මෙනී
සත් වරමින් අප පොහොනි කරනු මැන
ශුද්ධාත්මෙනී
ඔබ අභිමත අප සැලසුම් කළ මැන
ආලෝකය වී අප දිවි ගමනට

ජීවනයේ මග පහදා දෙනු මැන සමිඳුනි
වියවුල් බව්නුත් ගළවාලනු මැන සුරිඳුනි
නැණ නුවණින් ඔබ මග වටහා දී
ආලෝකය වී අප දිවි ගමනට

**අභ්‍යාසය:**

- ශුද්ධාත්ම ක්‍රියාකාරිත්වයට අනුකූල ව ගිහියන් ක්‍රියාත්මක වූ අවස්ථා නව ගිවිසුම ඇසුරෙන් සොයා ලියන්න.
- ක්‍රිස්තුන් වහන්සේට සාක්ෂි දැරීමට අභිවෘද්ධි ආලේපය ලබා සිටින පරිනත ඔබට කළ හැකි යහපත් ක්‍රියා ලැයිස්තු ගත කරන්න.

## අධ්‍යයනය සඳහා..

රෝම 8:139

ගලාති 5:1622

දෙවන වතිකාන මන්ත්‍රණ සභාවේ පොදු වන්දනා අංක 71

**මාගේ ජීවිතයට..**

අභිවෘද්ධි ආලේපය ලැබූ මා තුළ ඇති ශුද්ධාත්ම ක්‍රියාකාරිත්වය ලෝකයට දැක ගත හැකි විය යුතු ය.



ශුද්ධාත්මෙනි වඩිනු මැනේ.